**අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කිරීම කළ යුතු වේ. | ඉදිරියේදි ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා කටයුතු කරමි. |
| (ii) | පළාත් නිශ්චිත සංවර්ධන ආධාර වැඩ සටහන් යටතේ පානීය ජල ව්‍යාපෘතියේ බට ඇතිරිමේ වැඩ සඳහා අපේක්ෂිත ඇස්තමේන්තුව අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල වෙත අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ රු. 999,774 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල වැඩ නිමවී නොතිබුණද, මූල්‍ය ප්‍රකාශන වල අත්තිකාරම් වශයෙන් නොදක්වා වියදමක් වශයෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ මුදල වැඩ අවසන් වන තෙක් අත්තිකාරම් වශයෙන් පෙන්විය යුතු වේ. | ඉදිරියේදි කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| ---------------- | | ----------------- | ------------ | -------------------- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 5(12) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත් වල අත්සන් කිරීම්, නිලධාරින් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුණද, ඒ අයගෙන ආරක්ෂිත ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. | රීති, චක්‍රලේඛ අනුව ක්‍රියාකළ යුතු වේ. | ඉදිරියේදී එවැනි ආරක්ෂක ඇප සම්බන්ධයෙන් තීරණ ගනු ලැබේ. |
| (ii) | 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග තත්‍ය වියදම් සමග සසදා, අතිරික්ත හා ඌනතා පිළිබද හේතු දැක්වෙන ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රීති අනුව ක්‍රියාකළ යුතු වේ. | ඉදිරියේදී එවැනි ප්‍රකාශය පිළියෙල කර ඉදිරිපත් කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 396 | මාස හයක් ඉක්මවා ඇති රු. 27,000 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | දැනට එම චෙක්පත් මාරු කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,388,857 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.507,734 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - | - | 10,000 | - | - | - |
| කුලී | 1,800,000 | 2,652,811 | 2,634,511 | 18,300 | 1,800,000 | 1,472,413 | 1,472,413 | - |
| බලපත්‍ර ගාස්තු | 335,000 | 348,900 | 348,900 | - | 274,000 | 374,000 | 374,000 | - |
| වෙනත් ආදායම් | 3,851,750 | 4,052,203 | 2,473,469 | 2,588,635 | 3,365,000 | 2,032,549 | 1.601,956 | 1,010,326 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළයුතු ආදායම් රු. 8,064,240 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 5,456,880 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 68% ක් විය. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල සමඟ සමාලෝචිත වර්ෂයේ ආදායමද අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් දැනට අයකර ඇති අතර, මෙයින් උසාවි දඩ මුදලින් කොටසක් පමණක් අයවිය යුතුව ඇත. එය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. |

### 2.2.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ නිවාස, කඩ සහ පුද්ගලික ආයතනවලින් එකතු කරන ඝණ අපද්‍රව්‍ය සඳහා සේවා ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය සඳහා සේවා ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගාස්තු අයකිරීමට අදාලව මූලික කටයුතු කරමින් පවති. |

### 2.2.4 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන නිශ්චල දෙපල මාරුකිරීමේදි නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තුමේන්තුවෙන් 2017 සහ 2018 වර්ෂවල සෘජුව සහ ජංගම සේවය මගින් අයකරගත් අතිරේක මුද්දර ගාස්තු ගණනය කර අයකරගෙන නොතිබුණි. | අත්හැරුනු හිඟ ප්‍රමාණයට අදාල මුද්දර ගාස්තු සඳහා ලියවිලි පිළියෙල කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල කාර්ය සම්බන්ධයෙන් රෙජිස්ටාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධතා ඇතිකරගෙන ඇත. අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවති. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුභ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින දක්වා කරුණු 5 ක් සඳහා සකස්කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුමැතිය ලැබී නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස්කර අදාල අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | හෝටල්, බාබර්සාප්පු දැන්වීම්, බේකරි සහ අන්තරායක වෙළද ආයතන ආදිය සඳහා අතුරු ව්‍යවස්ථා අළුතෙන් සකස්කර සහා අනුමැතිය සමග යවා ඇති අතර වෙනත් ආදායම් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස්කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවති. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමැතිය ලබා ගැනීම සඳහා සකස්කරන ලද අතුරු ව්‍යවස්ථා 05 ක් අනුව සභාව විසින් ක්‍රියාත්මක කළයුතුව තිබූ ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාර සැලස්මක් සකස්කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කළ යුතු වේ. | සකස්කරන ලද අතුරු ව්‍යවස්ථා 5 අනුව ක්‍රියාත්මක කළයුතු වාර්ෂක ක්‍රියාකාරි සැලැස්ම දැන් පිළියෙල කෙරමින් පවති. |

(ඇ) තිරිසාර සංවර්ධන ඉලක්ක

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයක්ම ක්‍රියා කළ යුතුයි. කෙසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා මැණීම සඳහා දර්ශක හඳුනාගෙන ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණු සම්බන්ධයෙන් ආයතනයේ ඉලක්ක හඳුනාගෙන ඇති අතර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා කාර්යාලය, පුස්තකාල, පොළ සහ මහජන ක්‍රිඩාංගනය යන ස්ථාන පිහිටුවා ඇති සභාව සතු පර්චස් 505 ක ඉඩම් කැබැලි 07 ක ඉඩම් ඔප්පු සභාව විසින් ලබාගෙන නොතිබුණි. | ඔප්පු ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම්වල අයිතිය පිළිබඳ ලියවිලි ඉක්මනින් ලබා ගනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ තනතුරු වර්ග 6 කාර්ය මණ්ඩල පුරප්පාඩු 06 ක් පැවතුනි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | සභාවේ පවතින තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් ඒවා නිරාකරනය කර දෙන ලෙස ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපි යවා ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන වෙළඳ සැල් 87 සහ නිවාස 1908 ක් සඳහා 2011 වර්ෂයේ සිට වරිපනම් බදු තක්සේරුකර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා බලප්‍රදේශයේ සංවර්ධනය වූ ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම බද්ද අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ආධාර වැඩ යටතේ අක්කරේයිපත්තු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග 05 ක 605.5 m දුරට පානිය ජලය සඳහා බට ඇතිරීම් වැඩ සඳහා රු. 999,774 යෝජනා ඇස්තමේන්තුව අනුව ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයට ගෙවා තිබුණද, 150 m දිගට පල්ලිකුඩියිරුප්පු 02 වන කොට්ඨාශයේ මුහුදු බඩ මාර්ගයේ 2019 මැයි 31 දින දක්වා වැඩ ආරම්භකර නොතිබුණි. | අදාල වැඩ කඩිනමින් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | ඉදිරි මාසවල කෘෂිකර්ම කටයුතු නිමවන බැවින් මෙය කඩිනමින් නිමකර සම්පූර්ණ ව්‍යාපෘත්තිය නිම කරන බව ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය දැනුම් දී ඇති බව දන්වා සිටිමි. |

**3.5 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 03 ක නීතියානුකූල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාවේ නමට මාරු කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

**4 ගිණුම් ගතයුතු භාවය සහ යහපාලන**

**4.1 නිරවුල් නොවූ නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ යටතේ ආලිම් නගරයේ ඇතුලත මාර්ග ප්‍රතිසංස්කරනය කිරීමේ කොන්ත්‍රාතුව ප්‍රජා පාදක සමිතියකට භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් සභාවේ තාක්ෂණ නිලධාරින්ගේ ලිඛිත සනාථ කිරීම අනුව අදාල වැඩ සඳහා සභාවේ මෝටර් ග්‍රේඩර් මගින් කරන ලද වැඩ සඳහා රු. 42,000 ක් ප්‍රජා පාදක සමිතියටම ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |
| (ආ) | සභාවේ JCB යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ විපතට පත්වී රු. 115,128 ක වියදමින් අළුත්වැඩියා කර තිබුණි. මෙම වියදමින් රක්ෂණ සංස්ථාවෙන් රු. 37,500 ක් වන්දි මුදල් ලැබී තිබුණි. කෙසේ වෙතත් සභාව විසින් මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104(1) අනුව පොලිස් පැමිණිලි සහ පරික්ෂණය පවත්වා අලාභයේ ප්‍රමාණය, වගකියයුතු අය තීරණය කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි අදාල කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |
| (ඇ) | ජල සම්බන්ධතා ලබා ගැනීම සම්බන්ධයෙන් අක්කරෙයිපත්තු ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත 2016 වර්ෂයේ ගෙවීම මත වැට් බදු 11% වෙනුවට 15% ගෙවා තිබීමෙන් කොන්ත්‍රාත්කරු වෙත රු. 34,749 ක් වැඩපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |